# ශ්‍රී ලංකා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතේ සිදු විය යුතු සංශෝධනයන් පිළිබඳ අධ්‍යයනය: විශ්ව විද්‍යාල සිසුන්ගේ ඉදිරිදැක්ම ඇසුරින්

Minaz, M.N.M.[1], Imna M.I.F.[2] Ahamed, M.A.B.[3], Ahamed Sarjoon, R.[4]

[1 2 3 4] Department of Islamic Studies, South Eastern University of Sri Lanka

Correspondence: minazsrilanka@gmail.com

**සංක්ෂිප්තය**

*ශ්‍රී ලංකාවේ ජීවත්වන මුස්ලිම්වරුන් සඳහා ක්‍රියාත්මක වන මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතේ විය යුතු සංශෝධනයන් පිළිබඳ සමාජයේ සංවාදාත්මක තත්වයක් උදා වී ඇත. ඒ අනුව එකී සංවාදාත්මක තත්වයන් පිළිබඳව ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල වල අධ්‍යාපනය හදාරන මුස්ලිම් විද්‍යාර්ථීන් දරන අදහස මෙම අධ්‍යයනය තුළින් විස්තර කර ඇත. මේ සඳහා අවශ්‍ය දත්ත රාජ්‍ය සහ රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල වල අධ්‍යාපනය ලබන සිසු සිසුවියන්ගෙන් ලබාගෙන මෙම අධ්‍යයනය සිදු කර ඇත. මේ සඳහා සහභාගි වූවන්ගේ ප්‍රතිචාර සමාලෝචනය කළ විට පෙනී යන ප්‍රධානතම කරුණු කාරණා නම් දැනට ක්‍රියාත්මකව පවතින මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත පිළිබඳව බහුතරයක් වූ සිසුන් දැනුවත්භාවයකින් යුක්ත බවත් මෙම පනත යටතේ සිදු වන විවාහ සහ දික්කසාද ක්‍රමයන් තුළ ඇති න්‍යායාත්මක කරුණු සහ ක්වාසි අධිකරණය ව්‍යුහය තවදුරටත් සංශෝධනය ලක් විය යුතු බවත් ය. එලෙස මෙම මුස්ලිම් විවාහ හා දික්කසාද පනතේ සිදුවිය යුතු සංශෝධනයන් පිළිබඳ ඔවුන් මෙම පර්යේෂණය මගින් පෙන්වා දී ඇති කරුණු මෙම පනත සංශෝධනය කිරීමේ ක්‍රියාවලිය සඳහා වැදගත්වන අතර ඔවුන්ගේ එම අදහස් ප්‍රායෝගික තලයේ  ක්‍රියාත්මක කරවීම තුළින් ශ්‍රී ලංකාවේ  ක්‍රියාත්මක වන මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත තවදුරටත් සාධනීය තලයකට රැගෙන යා හැකි බව මෙම පර්යේෂණයෙන් පෙනී යයි.*

**කේන්ද්‍රීය වචන:** මුස්ලිම්වරුන්, විවාහය, දික්කසාදය, සංශෝධනය, නීතිය

## 01. හැඳින්වීම

සමස්ත ලෝකයේ සමාජ සන්ධර්භය දෙස සලකා බලන විට පෙනී යන ප්‍රධාන කරුණක් නම් එහි වෙසෙන විවිධ ආගමිකයන්, අනාගමිකයන් විවිධ ජාතීන් සහ ගෝත්‍ර වලට අයත් යන සියලු පිරිස් ඒ තුළ ජීවත් වන බවයි. ඒ සියල්ලන්ම තමන්ටම ආවේණික වූත් අනන්‍ය වූත් ප්‍රතිපදාවකට අනුව සිය ජීවිකාව හැඩගස්වා ගනිමින් ජීවත් වේ. එලෙස ඔවුන්ටම ආවේණික එකී ප්‍රතිපදාව සඳහා සිය සමාජ පද්ධතිය තුළ ඉහල පිලිගැනීමක් ලබා ගැනීමට කටයුතු කිරීම දැකගත හැකිය. ඕනෑම රටක් බහුවිධ ජාතීන් නියෝජනය කරන තත්වයක පැවතියත් සමස්ත බහුවිධ ප්‍රජාවන්ටම අයත් පොදු නීතියට අමතරව තනි තනි වශයෙන් සකසා ගත් පුද්ගල නීති ද එතුළ ඔවුන් අනුගමනය කරයි. ඒවා ඔවුන්ගේ ඇදහිල්ල සමග ඉතා සමීපව සම්බන්ධ වූත් අතිශය සංවේදී වූත් නීති රීති ලෙස හඳුනාගත හැකිය. තවද සිය රාජ්‍යයේ පොදු නීතිය උල්ලංඝනය නොකරමින් එවැනි වෙන් කරගත් පුද්ගල නීති ක්‍රියාත්මක කොට පවත්වාගෙන යාම ද එහි දක්නට ඇති විශේෂ තත්ත්වයකි. මෙලෙස ලෝකයේ දක්නට ඇති සියලු ආගම්



Proceedings of 8th International Symposium FIA, SEUSL, 04th August 2021
ISBN 978-624-5736-14-0

අතරින් ඉස්ලාමය යනු ආගමකට එහා ගිය ජීවන ක්‍රමයක් යැයි හැඳින්වීම එහි වූ මූලික මූලාශ්‍ර පිළිබඳ සහ ඉස්ලාම් දහමේ හරය පිළිබඳ අධ්‍යනය කිරීමේදී පෙනී යයි. එකී ජීවන මාර්ගය තුළ ජීවිතයේ සියලු අංග පිළිබඳ අවධාරණය කොට තිබීම ද එය අධ්‍යයනය කරගෙන යාමේදී පෙනීයන කරුණකි. ලෝකයේ වෙසෙන සියලු මුස්ලිම්වරුන් දෙස බලන විට ඔවුන් ඉහත සඳහන් අයුරින් එකී ජීවන මාර්ගයට අනුකූලව තම ජීවිතය හැඩ ගස්වා ගෙන තිබීම ඔවුනතර දැකගැනීමට ඇති පොදු ලක්ෂණයකි. ශ්‍රී ලංකාව යනු බහුවිධ ජනතාවගෙන් සමන්විත රාජ්‍යයකි. සිංහල, දමිළ, මුස්ලිම්, බර්ගර් සහ සෙසු තවත් ජාතීන් එහි දිවිගෙවන අතර එහි සමස්ත ජනතාව අතර ක්‍රියාත්මක වන පොදු නීතියක් බල පැවැත්වේ. ඒ අතර ඉහත කී පරිදි එහි වෙසෙන ඇතැම් ජාතීන් සිය ඇදහිල්ල මුල් කොටගත් එයට අනුබද්ධ, යම් විෂයකට සීමා වූ, ඔවුන්ගේම නීති රීති ප්‍රමාණයක් ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත පුද්ගල නීතියක් සේ පිහිටුවා බලාත්මක කොට ක්‍රියාත්මක කරයි. තවද එම පුද්ගල නීතිය ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක උත්තරීතර නීතියට පටහැනි නොවන අයුරින් පවත්වාගෙන යයි. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක උඩරට නීතිය, තේසවලාමේ නීතිය, මුස්ලිම් නීතිය යනු එවැනි පුද්ගල නීතීන් වලට උදාහරණ වේ. මේ අතරින් ශ්‍රී ලංකාවේ වෙසෙන මුස්ලිම්වරුන්ට අදාළ වන පරිදි මුස්ලිම්වරුන්ගේ එදිනෙදා ජීවිතයේ සිදුවන විවාහ සහ දික්කසාද කටයුතු, දේපල උරුමය සහ මස්ජිද් පරිපාලන කටයුතු සම්බන්ධයෙන් පොදු නීතියට පරිබාහිරව ක්‍රියාත්මක වන පුද්ගල නීතියක් අතීතයේ පටන් ආරම්භ කොටගෙන එවක පටන් කාලෝචිතව සංවර්ධනය වෙමින් මේ දක්වා පැවතගෙන එයි. විවිධ අවධි වලදී මෙම පුද්ගල නීති ඉස්ලාමීය දහමේ පදනමට උචිත ලෙස අනුගත වී සංශෝධනය වෙමින් ඉදිරියට පැමිණ ඇත. එය එසේ සිදුවූයේ මන්දයත් සමාජයේ විස්තාරණය වීම මත එවැනි කාලෝචිතව සිදු කළ යුතු නෛතික සංශෝධනයන් නීති පද්ධතියට අත්‍යාවශ්‍යය නිසාවෙනි.

නමුත් මෙලෙස අතීතයේ පටන් විකාශනය වෙමින් පැවති ශ්‍රී ලාංකීය මුස්ලිම් වරුන්ගේ පුද්ගල නීතිය මෑත කාලීන දශක කිහිපයක් තුළ සංශෝධනයට ලක් වීමේ අක්‍රමවත් බවක් පෙනී යයි. ඒ නිසාම සමාජයේ නෛතික පද්ධතිය තුළ සිදු වූ මෙම අක්‍රමිකතාව හේතු කොටගෙන වර්තමානයේ විවිධ ගැටලු උද්ගත වී ඇත. එතුලින් මෙම මුස්ලිම් නීතිය සම්බන්ධව සමාජය තුළ විවිධ සංවාදාත්මක තත්වයක් නිර්මාණය වෙමින් පවතී. මෙම මුස්ලිම් පුද්ගල නීතිය සම්බන්ධව මෙලෙස සමාජයේ ඇති වී තිබෙන විවිධ සංවාදාත්මක තත්වය මත ඒ පිළිබඳව විවිධ පාර්ශ්වයන් දක්වන ආකල්ප, අදහස්, යෝජනා සහ විවේචන පිළිබඳ සොයා බැලීමේ අවශ්‍යතාවයක් උද්ගත වී ඇත. ඒ අනුව ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල පද්ධතිය තුළ ඉගෙනුම ලබන මුස්ලිම් විද්‍යාර්ථීන් මෙම මුස්ලිම් පුද්ගල නීතියෙහි සිදුවිය යුතු සංශෝධනයන් පිළිබඳ දක්වන අදහස් මුල් කරගනිමින් මෙම අධ්‍යයනය සිදු කර ඇත.

## 02. සාහිත්‍යය විමර්ශනය

ශ්‍රී ලංකාව යනු බහු ආගමිකයන්ගෙන් සැදුම්ලත් රාජ්‍යයකි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකාවේ වෙසෙන මුළු ජනගහනයෙන් 9.7% ක මුස්ලිම් ප්‍රතිශතයක් සෙසු ජාතීන් සමග ජීවත් වේ. බහුතරයක් වූ බොදුනු ජනතාවක් ශ්‍රී ලංකාව තුළ වාසය කළ ද සියලු ආගමිකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කොට ක්‍රියාත්මක වන නීති පද්ධතියක් ශ්‍රී ලංකාව තුළ ස්ථාපිතව ඇත. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම එය තහවුරු කොට ද ඇත. මේ අතර ශ්‍රී ලංකාවේ වෙසෙන මුස්ලිම්වරුන් ගත් කල තවත් එක් සුවිශේෂත්වයක් ඇත. එනම් යෝනක, මැලේ, ජා, බෝරා, මෙමෝන් වැනි විවිධ අනන්‍යතාවයන් සහිත මුස්ලිම්වරුන් ශ්‍රී ලංකාව තුළ වාසය



Proceedings of 8th International Symposium FIA, SEUSL, 04th August 2021
ISBN 978-624-5736-14-0

කිරීමයි. ඔවුන්ගෙන් බහුතරයක් වූ පිරිස සුන්නි නිකායට අයත් ෂාෆි ගුරුකුලය නියෝජනය කරන ප්‍රජාවක් වේ.

අතීතයේ වෙළඳාම සිය ජීවිකාව කොට ගත් අරාබිවරුන් ශ්‍රී ලංකාව ඇතුළු දකුණුදිග ආසියානු කලාපයට සහ අග්නිදිග ආසියානු කලාපයට කළ ආගමනයත් සමගම ශ්‍රී ලංකාව ඇතුළු ඒ අවට කලාපය තුළ අරාබි ජනාවාසකරණය ආරම්භ විය. ඒ අතරින් ශ්‍රී ලංකාව තුළ ජනාවාසකරණයට ලක් වූ අරාබි ජනයා ඉස්ලාමයේ ආගමනයත් සමගම මුස්ලිම්වරුන් බවට පත් විය. තවද වෙළඳාමෙන් ඔබ්බට යමින් එවක ශ්‍රී ලංකාවේ තිබූ ස්වදේශික පාලන තන්ත්‍රයට ද සහය දෙමින් වෙළඳාම ආශ්‍රිතව ඇති කරගත් සබඳතා වලදී විදෙස් රටවල් සමග රාජ්‍යතාන්ත්‍රික කටයුතු වලට ද දායක වෙමින් රජුට සහය දෙන ලදී. මුස්ලිම්වරුන් ඉන් මෙරට ආර්ථිකයට විශාල දායකත්වයක් ලබා දීමට කටයුතු කර ඇත. මේ ආකාරයේ වූ දායකත්වයන් නිසාම මුස්ලිම්වරුන්ට මෙරට සමාජය තුළ පිළිගැනීමක් හිමි වූ අතර එතුලින් ඔවුන්ගේ මෙරට පදිංචිය ස්ථාවර විය. දශක ගණනාවක් මේ ආකාරයට දිවි ගෙවූ මුස්ලිම්වරුන්ට පෘතුගීසීන්ගේ මෙරට ආගමනය විශාල තර්ජනයක් විය. වෙළඳාමට බාධා පමුණුවමින් ඔවුන් සිදු කළ ක්‍රියාවන් වල ප්‍රතිඵලයක් ලෙස විශාල ස්වදේශික මුස්ලිම්වරුන් පිරිසක් වෙරළබඩ ප්‍රදේශවල සිට උඩරට රාජධානිය කරා සංක්‍රමණය විය. එසේ උඩරට රාජධානිය වෙත සංක්‍රමණය වූ මුස්ලිම්වරුන්ට උඩරට රාජධානිය පාලනය කළ රජුගේ රාජ්‍යයට සේවය කරමින් තම ආගමානුකූල ජීවිතය ද උපරිම නිදහසකින් යුතුව ගත කිරීමට ද අවස්ථා උදා විය. පසුකාලීනව ලන්දේසින්ගේ මෙරට ආගමනයත් සමහම ඉන්දුනීසියාවේ විසූ මැලේ මුස්ලිම්වරුන් මෙරටට ගෙන්වා විවිධ සේවාවල නිරත කරවීමට කටයුතු කළහ. තවද මෙරට විසූ ස්වදේශික මුස්ලිම් ප්‍රජාව තම සේවා අවශ්‍යතා වලට යොමු කර ගැනීමත් සමගම මුස්ලිම්වරුන් කෙරෙහි සහනශීලී ප්‍රතිපත්තියක් අනුගමනය කළහ.  ඕලන්ද පාලන සමයේ මෙරට මුස්ලිම්වරුන්ට යැයි වෙන්වූ විධිමත් නීති රීති නොවීය.

හුදෙක් එවක මුස්ලිම්වරුන්ගේ විවාහ සහ දික්කසාද ක්‍රමය මුස්ලිම් චාරිත්‍ර වාරිත්‍ර වලට අනුව පවත්වාගෙන යාමට පෘතුගීසීන් ඔවුන්ගේ පාලන සමයේ (ක්‍රි.ව 1505-1656) මුස්ලිම්වරුන්ට අවසර දී තිබුණි. නමුත් අධිකරණ කටයුතු වල දී එවක පැවති ගෝවේ නීතියට අනුව නීතිය ක්‍රියාත්මක වීම සිදු විය. මේ ආකාරයට එවක මුස්ලිම්වරුන් අතර පැවති විවාහ ක්‍රමය කදුත්තාන් (Kadutthan) නමින් හැඳින්වී ඇත. ඉන් අනතුරුව පසුකාලීනව ලංකාවේ පාලන බලය ලබාගත් ලන්දේසීන් ද මෙම විවාහ ක්‍රමය පිළිගත්තද මුස්ලිම්වරුන් සම්බන්ධ අධිකරණ කටයුතු වල දී මුහුණ දීමට සිද්ධ වූ අපහසුතා හේතුවෙන් ක්‍රි. ව 1770 අවධියේ ලන්දේසි ආණ්ඩුකාර ෆැලක් (Iman Willern Falack) විසින් එවක බතාවියේ පැවැති මුස්ලිම් නීති සංග්‍රහය මෙරටට ගෙන්වා එය මුලින්ම මෙරට විසූ මුස්ලිම් මුලාදෑනි වරුන්ගේ සලකා බැලීමට යොමු කළහ. නමුත් ඒ ආකාරයට ගෙන්වාගත් බතාවි නීතියට එවක ස්වදේශික මුස්ලිම් මුලාදෑනිවරුන් විරුද්ධ විය. නමුත් ෆැලක් ආණ්ඩුකාරවරයාගේ බලකිරීම මත ඔවුන්ට එය පිළිගැනීමට සිදු වූ අතර එය ‘Bysondere wetten aangaande mooren mahometanen’ නීතිය නමින් 1970 දී  ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත් ඇතුළත ලන්දේසි පාලන බල ප්‍රදේශ තුළ වාසය කළ මුස්ලිම් ජනයාට බලපැවැත්වෙන පරිදි නීති ගත කළහ. පසුව ලන්දේසීන් මෙරට පාලනය කළ අවධිය තාක් මුස්ලිම්වරු හා සම්බන්ධව ඒ නීතිය අනුව කටයුතු කළහ. එලෙස ලන්දේසි පාලනය අවසන් කරමින් ඉංග්‍රීසීන් මෙරට පාලනය කිරීම ආරම්භ කළහ. ඉංග්‍රීසීන්ට මෙරට පාලන බලය ස්ථාපිත කළ අවධියේ යම් කාලයක් ලන්දේසි නීතිය ම ක්‍රියාත්මක කිරීමට සිදුවිය. ඒ නිසාම එවක පැවති මුස්ලිම් නීතිය ද ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක වූ නමුත් පසුකාලීනව ඉංග්‍රීසීන් විසින් ක්‍රි. ව 1801 දී මුස්ලිම්වරුන් අතර දේපළ නීතිය හා දේපල උරුමය පිළිබඳ අනුප්‍රාප්තික නීතියක් සහ මුස්ලිම්වරු අතර ඇතිවන ගිවිසුම් හා ගනුදෙනු



Proceedings of 8th International Symposium FIA, SEUSL, 04th August 2021
ISBN 978-624-5736-14-0

සම්බන්ධ මුස්ලිම්වරුන්ට බලපැවැත්වෙන පරිදි නීති සංග්‍රහයක් පිලියෙල කරමින් නව ප්‍රඥප්තියක් පනවන ලදී. පසුව ඉංග්‍රීසීන් විසින් ලන්දේසින් එවක පැණවූ මුස්ලිම් නීති සංග්‍රහය ද 1801 නීති ප්‍රඥප්තිය ද ඉස්ලාම් ආගමික මූලධර්ම මූලාශ්‍රයක් ලෙස යොදාගෙන ලාංකීය මුස්ලිම්වරුන්ට බලපැවැත්වෙන පරිදි නීති සංග්‍රහයක් කෙටුම්පත් කිරීමට 1806 අගෝස්තු 5 වන  දින කොමිෂන් සභාවක් පිහිටුවනු ලැබීය. පසුව එවක ශ්‍රී ලංකාවේ අගවිනිසුරු සර් ඇලෙක්සැන්ඩර් ජොන්ස්ටන් විසින් Mohamedan code of 1806 නැතහොත් 1806 අංක 14 දරන ප්‍රඥප්තිය (මහම්මත් නීති සංග්‍රහය) ලෙස නීති සංග්‍රහයක් බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා වෙත පිළිගැන්වූ අතර එමගින් ලන්දේසීන් විසින් පැනවූ මුස්ලිම් නීතිය සහ ක්‍රි.ව 1801 දී පැනවූ ප්‍රඥප්තිය අවලංගු කිරීමක් ද සිදු නොකළහ. නමුත් පසුකාලීනව පැනවූ 1833 යුක්තියේ ප්‍රඥප්තිය මගින් 1801 ප්‍රඥප්තිය අහෝසි කළ අතර 1799 ලන්දේසි ප්‍රකාශනයේ විධි විධාන යටතේ එවක පැවති මුස්ලිම් නීතිය තවදුරටත් බලාත්මක විය. එතුලින් මුස්ලිම්වරුන්ට මුස්ලිම් නීතිය යටතේ පාලනය වීමට ඇති අයිතිය තවදුරටත් ප්‍රකාශිතව තහවුරු විය. තවද පසුකාලීනව 1896 අංක 8 දරන මොහොම්මදාන් විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පනත මගින් මුස්ලිම් විවාහ ලියාපදිංචිය පිළිබඳ විධිවිධාන සැලසීය. උඩරට රාජධානිය ඉංග්‍රීසීන් යටත් කළ පසු 1852 අංක 5 දරණ එවක ඉංග්‍රීසි නීතිය ශ්‍රී ලංකාවට හඳුන්වා දීමේ ආඥා පනතෙහි විධිවිධාන මගින් 1806 මහම්මත් නීති සංග්‍රහය පහත රට මුස්ලිම් ප්‍රජාවට පමණක් සීමා නොවී දිවයින පුරාම වාසය කරන මුස්ලම් ප්‍රජාවටම අදාල කරන ලදී. යම් ආකාරයකට මුස්ලිම් නීතිය එවක ක්‍රියාත්මක වුවද අධිකරණ කටයුතුවල දී යම් නීතිමය ගැටලු ඇති වූ විටෙක මුස්ලිම් සිරිත් විරිත් වලට අනුව ඒවා නිරාකරණය කිරීම ද සිදුවිය. නමුත් එසේ සිදු කිරීම නීතිය නිහඬ වන විටෙක දී පමණක් සිදුවිය. එවක දක්නට ලැබූ 1806 මහම්මත් නීති සංග්‍රහයේ ඉස්ලාමීය නීතියට අනුකූල නොවන අංග ද ඇතුළත් විය. අනියම් භාර්යා සේවනය වැනි ඉස්ලාමීය නීතියට පටහැනි අංග ඒ තුළ අන්තර්ගත වී තිබීම ඒවාට උදාහරණ වෙයි. මෙවැනි එම නීති සංග්‍රහයේ මූලධර්ම ඉස්ලාම් ධර්මයේ මූලධර්ම මත සකස් නොවීම වැනි හේතුමත විසිඑක් වන සියවසේ මුල් භාගයේ විසූ මුස්ලිම් නායකයන් ඒ පිළිබඳව කටයුතු කිරීම ඉදිරියට ගෙන ගියහ. පසුව එය නිවැරදි කිරීමට එම්. ටී. අක්බාර් විනිසුරුතුමා ගෙන ආ නිර්දේශ මත 1929 අංක 27 දරන මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත ගෙන ආහ. එතුලින් පෙර තිබූ මුස්ලිම් නීතියේ ඇතැම් අංග අවලංගු කරන ලදී. තවද මෙම පැනවූ නව පනත මගින් මුස්ලිම් ජාතිකයන් හා සම්බන්ධයෙන් මුස්ලිම් නීතිය යටතේ ගැනෙන නඩු විභාග කිරීමට ඉස්ලාම් නීතියේ පවතින අධිකරණ පද්ධතියට සමාන ක්වාසි උසාවි ක්‍රමයක් ශ්‍රී ලංකාවේ ස්ථාපිත කරන ලදී. මෙම නව පනත මගින් දැක්වූ කරුණු මත මුස්ලිම්වරුන් අනිවාර්යෙන්ම මුස්ලිම් නීතිය යටතේ විවාහ විය යුතු බව සඳහන් වී තිබිණි.

මේ අතර දේපළ නීතිය යටතේ දේපල උරුමය පිළිබඳ ඇතිවූ ගැටලුවලදී මුස්ලිම්වරුන්ට 1844 අංක 21 දරණ අන්තිම කැමති පත්‍ර ආඥා පනත යටතේ කටයුතු කිරීමට සිදුවිය. එනිසාම 1931 අංක 10 දරණ මුස්ලිම් තෙස්තමේන්තු රහිත දේපල අනුප්‍රාප්තිය සහ වකුෆ් පිළිබඳ ආඥා පනත පනවා ඉස්ලාම් භක්තිකයන්ට එතෙක් අවිනිශ්චිතව හා අස්ථාවරව තිබූ කාරණා පිළිබඳ නිශ්චිත නීතියක් හඳුන්වා ඔවුන්ට තම දේපල උරුම වීම සහ දේපල තෑගි ලබාදීමට විධිවිධාන පැනවිය. මෙලෙස මෙම මුස්ලිම් නීතිය තවත් සංවර්ධනය වෙමින් 1951 අංක 13 දරණ මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත මගින් නැවතත් ප්‍රතිසංස්කරණයට ලක්විය. එනම් ක්වාසි අධිකරණය ලබාදෙන තීන්දු වලට සෑහීමකට පත්විය නොහැකි නම් ඉහළ අධිකරණවලට අභියාචනා කිරීමට ඇති හැකියාව ලබාදීම වැනි අවස්ථා එතුලින් උදා කර දීමයි. මෙම පනත 1954 අගෝස්තු 01 දින සිට ක්‍රියාත්මක විය. පසුව පනතේ විධි විධානයන්හි වෙනස්කම් ගණනාවක් 1954 අංක 31, 1955 අංක 22, 1965 අංක 01, 1965 අංක 05, 1969 අංක 32,



Proceedings of 8th International Symposium FIA, SEUSL, 04th August 2021
ISBN 978-624-5736-14-0

1975 අංක 41 යනාදී වශයෙන් කාලානුරූපීව සංශෝධනයට ලක් විය. නමුත් ගැටලුවට කරුණ නම් ඊට පසුකාලීනව උද්ගත වූ සමාජ ගැටලු වලට පිළිතුරු සැපයීමට මෙම පනත කාලෝචිතව සංශෝධනයකට ලක් කර ගැනීමට නොහැකි අවස්ථාවක් උදාවීමය.

ඒ සඳහා 1972 ෆාරුක් කමිටුව, 1984 කනගරත්න කමිටුව, 1990 ෂහාබ්දීන් කමිටුව, 2009 සලීම් මර්සූෆ් කමිටුව වැනි කමිටු රාශියක් මෙම නීතියෙහි සංශෝධනයන් සිදු කළ යුතු ආකාරය පෙන්වා දී තිබුනත් එම කමිටු වාර්තාවල සඳහන් වූ යෝජනා නිසි ලෙස ක්‍රියාත්මක කර ගැනීමට නොහැකි වී ඇති බව පෙනී යයි. ඒ තුළින් සමාජයේ කාන්තා පාර්ශවයට සිදුවූ අසාධාරණකම් සහ ක්වාසි උසාවි ක්‍රමයේ විවිධ අක්‍රමිකතා තවදුරටත් ඇතිවීම සමාජයෙන් වාර්තා වූ අතර ඒවා වැලැක්වීමට ක්‍රියාමාර්ග ගත හැකි යාන්ත්‍රණය ද නිහඬ වූ ස්වරූපයක් දක්නට ලැබී ය. වර්ෂ 2020 වන විටත් විවිධ සංවාද සිවිල් සංවිධාන අතර, ව්‍යවස්ථාදායකය ඇතුළු මැතිවරණ වේදිකා තුළ ඇති වුවත් ඒ තත්ත්වයෙහි වෙනසක් නොවීය. නමුත් සිවිල් සමාජය තුළ මෙහි සිදුවිය යුතු සංශෝධනයන් පිළිබඳ විශාල කතිකාවතක් නිර්මාණය වෙමින් තවදුරටත් පවතී.

## 03. පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය විස්තරාත්මක විශ්ලේෂණ ක්‍රමෝපායන් (Descriptive) අනුගමනය කරමින් සිදු කරන ලද පර්යේෂණයක් වන අතර එහිදී ප්‍රාථමික දත්ත රැස් කිරීම ශ්‍රී ලංකාවේ රාජ්‍ය හා රාජ්‍ය නොවන විශ්ව විද්‍යාලවල අධ්‍යාපනය හදාරන මුස්ලිම් උපාධි අපේක්ෂකයින්ගේ තොරතුරු මත පදනම්ව සිදු කරන ලදී. එකී සිසුන්ගේ දත්ත ලබා ගැනීම මාර්ගගත ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කිරීම මගින් සිදු කළ අතර එය දෙමළ, සිංහල සහ ඉංග්‍රීසි යන භාෂා තුනකින් ඔවුන්ට යොමු කරන ලදී. පර්යේෂණයේ ඊළඟ පියවර ලෙස දත්ත විස්තර කිරීම, පරීක්ෂා කිරීම සහ විශ්ලේෂණය කිරීම සිදුකරන ලදී. ඒ සඳහා ලබාගත් දත්ත විශ්ලේෂණය කොට ද්විතියික මූලාශ්‍ර ලෙස යොදා ගත් ඉස්ලාමීය අධ්‍යයනයේ ප්‍රධානතම මූලාශ්‍ර වන ශුද්ධ වූ අල් කුර්ආනය, අල් හදීස් ග්‍රන්ථ සහ නෛතික මූලාශ්‍ර ලෙස ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත 1951 අංක 13 දරණ මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත සහ පසුකාලීනව එහි වෙනස්කම් සිදු කළ සංශෝධන පනත් ආශ්‍රිතව ඒවායේ අදාළ න්‍යායන් සහ මූලධර්මවලට අනුකූලව ගැටලුවට තුඩු දුන් විෂය සාකච්ඡාවට බඳුන් කරන ලදී.

## 04. ප්‍රතිඵල සහ සාකච්ඡාව

ඕනෑම සමාජ විද්‍යාත්මක පර්යේෂණයක් සිදු කිරීමේදී දත්ත විශ්ලේෂණය කිරීම සහ පැහැදිලි කිරීම වඩාත් වැදගත් පියවරක් ලෙස සලකනු ලැබේ. මෙම අධ්‍යයනයේ මූලික පරමාර්ථය වූයේ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතේ සිදු විය යුතු සංශෝධනයන් පිළිබඳ ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල වල ඉගෙනුම ලබන මුස්ලිම් විද්‍යාර්ථීන්ගේ අදහස පිළිබඳ අධ්‍යනය කිරීමය. ඒ අනුව මෙම පර්යේෂණයේ දී සිසුන්ගේ අදහස් ලබා ගැනීමට භාවිතා කළ ප්‍රශ්නාවලිය සඳහා ඔවුන් ලබා දුන් පිළිතුරු මත නිගමනවලට එළඹීම සහ සුදුසු යෝජනා සම්පාදනය කිරීම සඳහා වැදගත් දත්ත විමර්ශනය කර දැක්වීම මෙහිදී සිදු වේ.

### 04.1. පර්යේෂණය සඳහා සහභාගි වූ පිරිස

මෙම පර්යේෂණය සඳහා යොදා ගත් සියලු විද්‍යාර්ථීන් ශ්‍රී ලංකාවේ ස්ථාපිත රාජ්‍ය සහ රාජ්‍ය නොවන විශ්ව විද්‍යාලවල අධ්‍යාපනය ලබන මුස්ලිම් උපාධි අපේක්ෂකයින් වේ. ඒ අනුව



Proceedings of 8th International Symposium FIA, SEUSL, 04th August 2021
ISBN 978-624-5736-14-0

රාජ්‍ය විශ්ව විද්‍යාල 22 ක සහ පුද්ගලික විශ්ව විද්‍යාල 5 ක මුලු සිසුන් 257ක ප්‍රමාණයක් මේ සඳහා අදහස් පළ කරන ලදී.

| ලබා දුන් පිළිතුර | සිසුන් සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| රාජ්‍ය විශ්ව විද්‍යාල වල අධ්‍යාපනය ලබන සිසුන් | 211 | 82% |
| පුද්ගලික විශ්වවිද්‍යාල වල අධ්‍යාපනය ලබන සිසුන් | 46 | 18% |
| එකතුව | 257 | 100% |

වගුව 1

## 04.2. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන මුස්ලිම් විවාහ හා දික්කසාද නීතිය පිළිබඳ විශ්ව විද්‍යාල විද්‍යාර්ථීන්ගේ දැනුවත්භාවය

ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත පිළිබඳව මෙම පර්යේෂණයට සහභාගී වූ සිසුන්ගේ ඇති දැනුවත්භාවය විමසූ විට ඒ අතරින් 82% ක ප්‍රතිශතයක් මෙම නීතිය පිළිබඳව දැනුවත්ව සිටි බවත් තවත් තවත් 18% ක සිසුන් ප්‍රතිශතයක් ඒ පිළිබඳව නොදැන සිටි බවත් පවසා සිටියි. මෙහිදී වැඩි පිරිසක් වූ ප්‍රතිශතය ඒ පිළිබඳව දැනුවත්ව සිටීම අනුව පෙනී යන්නේ විශ්ව විද්‍යාල විද්‍යාර්ථීන් වන ඔවුන්ව ද ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන මෙම මුස්ලිම් පුද්ගල නීතිය සංශෝධනය කළ යුතු අවස්ථා වලදී සම්බන්ධ කර ගත යුතු බවත් රටේ මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතේ සංශෝධනයක් සිදු කරන විට උසස් අධ්‍යාපනය හදාරන විද්‍යාර්ථීන්ගේ අදහස් හා යෝජනා ඇතුලත් කර ගැනීම වැදගත් බවය. මන්ද යත් විශ්ව විද්‍යාල අධ්‍යාපනයෙන් පසු සමාජයේ නායකත්වය භාර ගැනීමට නියමිත ඔවුන්ට අනාගතයේ උද්ගත විය හැකි ගැටලු ගණනාවක් විසඳා ගැනීමට ඉන් ලැබෙන පන්නරය ඔවුන්ට වැදගත් වේ. ඒ අතරම පෙන්වා දිය හැකි තවත් කරුණක් නම් මෙම මුස්ලිම් පුද්ගල නීතිය සම්බන්ධව විශ්ව විද්‍යාල වල ඉගෙනුම ලබන මුස්ලිම් විද්‍යාර්ථීන්ගේ මුස්ලිම් විවාහ නීතිය පිළිබඳ දැනුවත්භාවය පිළිබඳ විමසීමේදී 18%ක ප්‍රතිශතයක් ඒ පිළිබඳව නොදැන සිටිමය. විද්‍යාර්ථීයෙකු ලෙස උසස් අධ්‍යාපනය ලබා ගැනීමට විශ්ව විද්‍යාලයකට පැමිණ ඇති අවස්ථාවකත් මෙම නීතිය පිළිබඳ කිසිදු දැනුවත් භාවයකින් තොරව සිටීමෙන් පෙනී යන්නේ ඔවුන් හැදෑරූ අධ්‍යාපනය තුළ කිසියම් අසම්පූර්ණ භාවයක් තිබෙන බවය.

## 04.3. විවාහය සඳහා කාන්තාවගේ අනුමැතිය ලබාගැනීම

ඉස්ලාම් දහම පිළිබඳව හැදෑරීමේදී එහි මූලික මූලාශ්‍ර වලට අනුව එකී සමාජයේ පදනම ලෙස පවුල හැඳින්විය හැක. එලෙස එම සමාජයේ පදනම වන පවුලේ ව්‍යුහය විවාහය යන බැඳීම මත වඩාත් ශක්තිමත් වේ. මුස්ලිම්වරුන් විසින් එය ඔවුන් දිවැසිවරුන් ලෙස හඳුන්වන නබිවරුන්ගේ මග යනුවෙන් දේශනා කරයි. ඒ අනුව එසේ හඳුන්වන විවාහය අනුමත වීමට අත්‍යාවශ්‍යය අවශ්‍යතා තුනක් සපුරා ගැනීම අවශ්‍ය වේ. ඒවා නම් මනාලයා සහ මනාලියගේ කැමැත්ත, මනාලියගේ භාරකාරු (වලී) හඳුනාගැනීම, භාරකරු විසින් මනාලියගේ භාරකාරත්වය මනාලයා වෙත පැවැරීම (ඊජාබ් සහ කබූල්) යන ප්‍රධාන අවශ්‍යතාවන් වේ. එබැවින් විවාහ ගිවිසුම ඇති කර ගන්නා පාර්ශවයන් ලෙස මනාලයා සහ මනාලියගේ භාරකාරු වාචික ගිවිසුමක් මගින් මෙම විවාහය සිදු කර ගැනීම අතීතයේ පටන් පවත්වාගෙන ආ මුස්ලිම් සම්ප්‍රදායක් විය. එහිදී ඉස්ලාමීය නීතියට අනුව විවාහය සිදු කිරීම සඳහා භාරකරුවා විසින් සිදුකිරීමට නියමිත විවාහය සම්බන්ධයෙන් කාන්තාවගේ කැමැත්ත ලබා ගැනීම අනිවාර්ය වේ. එයින් පෙනී යන්නේ වැඩිවියට පත් කාන්තාවන් බලහත්කාරයෙන් විවාහ කර දීම ඉස්ලාම් දහම අනුමත නොකරන බවයි. එයට පිටුපාමින් කාන්තාවන්ගේ අනුමැතියකින්



Proceedings of 8th International Symposium FIA, SEUSL, 04th August 2021
ISBN 978-624-5736-14-0

තොරව ඇයව විවාහ කර දුන් අවස්ථා වල එම විවාහයන් අහෝසිකර දැමීමට මුහම්මද් නබි නායක තුමාණන්ගේ අවදියේ වූ පූර්වාදර්ශ ද ඇත. සමාජය දිනෙන් දින විස්තාරණය වෙමින් නූතන අවධිය වන විට මහත් සංකීර්ණ තත්ත්වයකට පත් වී ඇත. එම සංකීර්ණය ස්වරූපය අද වන විට සමාජයේ සෑම ක්ෂේත්‍රයකම දැක ගත හැක. පවුල් ජීවිතය සම්බන්ධය විවාහය ගත් කළ එයටත් එකී න්‍යාය බලපා ඇත.

මෙම විවාහ කටයුතු වලදී ද ඇති වන එම සංකීර්ණ ස්වරූපය නිරවුල් ගැනීමට ලිඛිත ගිවිසුම් මනා පිටිවහලක් වනු ඇත. ඒ අනුව විවාහය ලිඛිත ගිවිසුමක් මගින් සනාථ කර ගැනීමට විධිවිධාන සැලසීම ගැටලු අවම කර ගැනීමට උපකාරී වේ. එහෙත් දැනට බල පැවැත්වෙන මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතට අනුව කාන්තාවගේ කැමැත්ත ලබා ගැනීමට අදාළව අත්සනක් ලබා ගැනීමට විධිවිධාන යොදා නොමැති බැවින් විවාහ ගිවිසුමකට කාන්තාවන්ගේ අත්සන ලබා ගැනීමට විධිවිධාන සැලසීමක් සිදු කොට නැත. ඒ නිසාම එතුලින් උද්ගත විය හැකි තත්ව සැලකිල්ලට ගෙන විවාහය සඳහා කාන්තාවන්ගේ අත්සන ලබා ගැනීමට උසස් අධ්‍යාපනය හදාරන විද්‍යාර්ථීන් දක්වන කැමත්ත පිළිබඳ මෙම පර්යේෂණයේ දී විමසීමකට ලක් විය.

| ලබා දුන් පිළිතුර | සිසුන් සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| කාන්තාවන් අත්සන් කළ යුතුයි | 218 | 85% |
| කාන්තාවන් අත්සන් නොකළ යුතුයි | 39 | 15% |
| එකතුව | 257 | 100% |

වගුව 2

එහිදී අදහස් දැක්වූ 85% ක ප්‍රතිශතයකින් විවාහ ගිවිසුම සඳහා කාන්තාවගේ අත්සන යෙදීමට විධිවිධාන සැලසීමට කැමැත්ත පළ කර තිබූ අතර තවත් 15%ක ප්‍රතිශතයකින් ඒ සඳහා අකමැත්ත ප්‍රකාශ කර තිබීම දැකගත හැකි විය. එසේ ඉහත අකමැත්ත ප්‍රකාශ කොට අදහස් දැක්වූ විද්‍යාර්ථීන් අතරින් එලෙස විවාහ ගිවිසුමට කාන්තාවගේ අත්සන යෙදීමට අවස්ථාව සැලසීමට අකැමැත්තක් පළ කළේ මන්දැයි යන්න විමසූ විට ඔවුන් පවසා සිටියේ පවත්වාගෙන ආ විවාහ සම්ප්‍රදාය එලෙසම ක්‍රියාත්මක කරවීමට ඔවුන් තුළ වැඩි රුචියක් දක්වන බවත් විවාහ ලියාපදිංචි කිරීමේ දී එම ස්ථානයට කාන්තාව සහභාගී කරවීමේ අසීරුතාවක් තිබෙන බවත් යන හේතු මත ඔවුන් ඒ සඳහා අකමැත්ත ප්‍රකාශ කළ බව අදහස් කර ඇත. නමුත් ඉහත සඳහන් කළ සමාජයේ ඇති වන විවිධාකාර සංකීර්ණතා මත නූතන සමාජය තුළ ගත යුතු ඇතැම් කාලෝචිත තීන්දු වලදී නම්‍යශීලී විය යුතු වන බැවින් විවාහය සඳහා කාන්තාවන්ගේ අනුමැතිය ලබා ගැනීම පිණිස අත්සන ලබා ගැනීමට අකමැත්ත පළ කිරීම එතරම් සාධනීය තත්ත්වයක් නොවේ. මෙම ගැටළුව සම්බන්ධයෙන් තවදුරටත් පුළුල් ලෙස සාකච්ඡා කරමින් විවාහ ගිවිසුමෙහි නෛතික ස්වරූපය පිළිබඳ ඔවුන්ගේ අදහස් විමසීමක් සිදු වූ අතර දෙපාර්ශවයක් අතර සිදුවන විවාහය පිළිගත් ලියාපදිංචියක් මගින් සනාථ කිරීම අනිවාර්ය කිරීම සම්බන්ධයෙන් ඔවුන්ගෙන් විමසන ලදී. ඒ සඳහා ඔවුන් අතරින් 90% ක ප්‍රතිශතයකින් දෙපාර්ශවයක් අතර සිදුවන විවාහ ගිවිසුම පිළිගත් ලියාපදිංචියකට නතු කර වීම අනිවාර්ය කළ යුතු බවද තවත් 10% ක ප්‍රතිශතයක් එවැනි වුවමනාවක් අවශ්‍ය නොවන බවත් අදහස් කර සිටියහ. මෙහිදී අවධාරණය කළ යුතු කරුණක් නම් ඉස්ලාමීය නීතියේ වුවද ගිවිසුමකට එළඹීමේ දී එම ගිවිසුම ලිඛිතව තබා ගත යුතු බව පැවසූ නබි මුහම්මද් තුමාණන්ගේ පූර්වාදර්ශ පවතී. එබැවින් විවාහයක් වැනි ජීවිතයේ අත්‍යවශ්‍ය බැඳීමක් ලියාපදිංචියක් මගින් සනාථ කොට තබා ගැනීමෙහිලා කිසිදු වරදක් දක්නට නොලැබේ. තවද එය අධිකරණ ක්‍රියාවලිය සඳහා ද පහසුවක් සලසන බැවින් විවාහය ලියාපදිංචියක් මගින් සනාථ කර තැබීමට විධිවිධාන සැලසීමට අප අවස්ථා සැලසිය යුතු වේ. නමුත් ඒ සඳහා



Proceedings of 8th International Symposium FIA, SEUSL, 04th August 2021
ISBN 978-624-5736-14-0

කැමැත්තක් නොදැක්වූ පිරිස තමන් කුමන කාරණයක් නිසාවෙන් ඒ සඳහා අකමැති දැයි විමසා බැලූ විට ඔවුන් අදහස් කරේ විවාහ ගිවිසුමේ දී භාරකරුවා හා ස්වාමි පුරුෂයා අතර සිදු කරන වාචික ගිවිසුම පමණක් ප්‍රමාණවත් බව අදහස් කරන බවත් මුස්ලිම්වරුන්ගේ විවාහ සම්ප්‍රදාය නොවෙනස්ව ඉදිරියට පවත්වාගෙන යා යුතු බව අදහස් කරන බැවින් එවැන්නක් අවශ්‍ය නොවන අදහස් කොට ඇත. නෛතික ආකාරයට ලියාපදිංචියක් මගින් විවාහ ගිවිසුමකට එළඹීම ඉස්ලාමීය සමාජයට අගතියක් අත් නොවන අතර එමගින් සමාජ ගැටළු අවම කර ගැනීමට අවස්ථාවක් උදා වෙන බැවින් මෙම ප්‍රශ්නය සාධනීය කෝණයකින් බලා විවාහය ලියාපදිංචි කර ගැනීමට විධිවිධාන සැලසීමට කටයුතු කිරීම කාලෝචිත ක්‍රියා මාර්ගයක් බව පෙනී යයි.

## 04.4. කාන්තාවන්ට හා පිරිමි පාර්ශ්වයට විවාහවීම සඳහා ඇති අවම වයස

ඉස්ලාමීය නීතියට අනුව විවාහ වීම සඳහා අවම වයස් සීමාවක් පැනවා නැත. නමුත් ඉස්ලාමීය නීතිය සෑම විටම පවසා සිටින්නේ වැඩිවියට පත්, විවාහය සඳහා කායික මෙන්ම මානසික තත්ත්වයන් සපුරන්නේ නම් පමණක් කාන්තාවක් හෝ පිරිමියෙකු විවාහ වීමට සුදුසුකම් ලබන බවයි. දැනට ක්‍රියාත්මක ශ්‍රී ලංකා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතේ කාන්තාවකට විවාහ විය හැකි අවම වයස ලෙස දක්වා ඇත්තේ වයස අවුරුදු 12 වේ. ඒ අතර ඊටත් වඩා අඩු වයසින් පසු වන කාන්තාවන් ක්වාසි වරයාගේ අනුමැතිය මත විවාහ කර දීමට බලය ලබා දී ඇත. නමුත් දිනෙන් දින දියුණු වන සමාජ ක්‍රමය තුළ පෙර අවධි වලට වඩා අධ්‍යාපනය වෙත සිසු සිසුවියන් යොමු වීමේ ප්‍රවණතාවයක් ඇති අවධියක 18න් පහල දැරියන් විවාහ කර දීමේ ක්‍රමය සමාජය තුළ කිසියම් සංවාදාත්මක තත්ත්වයක් නිර්මාණය කර ඇත. තවද එම සංවාද අතර දැරියක විවාහ ජීවිතයකට එළඹීමේදී ඇති විය හැකි කායික සහ මානසික වශයෙන් වූ ශාරීරික ගැටලු පිළිබඳව ද අවධානය යොමු වී ඇත. විවාහ වීම සඳහා අවම වයස පිළිබඳව මේ ආකාරයෙන් සංවාදයක් සමාජය තුළ පවතින අතරතුර ඒ පිළිබඳව විශ්ව විද්‍යාල වල ඉගෙනුම ලබන මුස්ලිම් විද්‍යාර්ථීන්ගේ අදහස විමසා බැලීම ද මෙම පර්යේෂණය විසින් සිදු කර ඇත.

| ලබා දුන් පිළිතුර | සිසුන් සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| එවැනි සීමාවක් පැනවිය යුතු බව | 205 | 79.6% |
| එවැනි සීමාවක් පැනවිය නොයුතු බව | 52 | 20.33% |
| එකතුව | 257 | 100% |

වගුව 2

ඒ අනුව පර්යේෂණයට සහභාගී වූ මුළු පිරිසෙන් 79.6%ක බහුතර ප්‍රතිශතයක් වූ පිරිස පවසා සිටින්නේ පවතින නීතියේ ඇති අවම වයස පිළිබඳ වගන්ති සංශෝධනය විය යුතු බවයි. ඒ අතරම තවත් 20.33% ක ප්‍රතිශතයක් පවතින නීතිය වෙනස් නොකළ යුතු බව අදහස් කරන බව පෙනී යයි. කුඩා වයසකදී විවාහ වීම තුළින් කාන්තා දරුවන්ට ඇති විය හැකි හානි වැළැක්වීමේ අරමුණින් කුඩා වයසේ දී සිදු වන විවාහයන් වැළැක්වීම සඳහා වයස් සීමාවක් දැමීම ඉතා උචිත බව ඉහත අදහස් දැක්වීම් අනුව බව පෙනී යයි.

## 04.5. බහු භාර්යා විවාහ ක්‍රමය

ඉස්ලාමීය මනුෂ්‍ය ස්වභාවයට ගැලපෙන ජීවන රටාවක් ලෙසින් නිර්මාණය වී ඇති බැවින් එහි ඉගැන්වීම් වලට අනුව ජීවිතය සකසා ගන්නන් සෑම විටම තම ජීවිතය ඒ අනුව පවත්වා ගැනීමට වෙහෙසෙයි. ඉතිහාසය පුරාම ජීවත් වූ මුස්ලිම්වරුන්ගේ ජීවිතය දෙස අධ්‍යයනය කිරීමේදී ඒ බව මැනවින් පැහැදිලි වේ. පිරිමියෙකු එකම අවස්ථාවක එක් භාර්යාවකට වඩා වැඩි සංඛ්‍යාවක් නීතියානුකූලව භාර්යාවන් වශයෙන් විවාහ කොට පෝෂණය කිරීම බහු



Proceedings of 8th International Symposium FIA, SEUSL, 04th August 2021
ISBN 978-624-5736-14-0

භාර්යා විවාහය ලෙසින් හැඳින්වේ. මිනිස් ස්වභාවයෙන්ම ඇතිවන තත්ව සහ නොවැළැක්විය හේතු නිසා ඇතිවන විවිධ වාතාවරණ වල දී එය නොවැලැක්විය හැකි කරුණක් ලෙස අපට දැක ගත හැක.

*ස්ත්‍රීන් අතරින් ඔබට කැමති අයවලුන් දෙදෙනෙකු බැගින් හෝ තුන් දෙනෙකු බැගින් සිව් දෙනකු බැගින් හෝ ඔබ ආවාහ කර ගන්න .ඔවුන් අතර ඔබට සාධාරණ ලෙස හැසිරිය නොහැකි යැයි බියක් ඇති වේ නම් එක් ස්ත්‍රියක් ආවාහ කරගන්න (4:3)* යන ශුද්ධ වූ අල්-කුර්ආනීය පාඨය බහුභාර්යා විවාහයට දෙන ලද අනුමැතිය වශයෙන් ඔවුන් සලකනු ලැබේ.

මෙවැනි විවාහ ක්‍රමයක් ඉදිරිපත් කර තිබීම මගින් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවයට ඉන් බලපෑමක් ඇති වන බවටත් කාන්තාව ඉන් අගතියට පත් වන බවටත් සමාජය විවේචනයක් පවතී. නමුත් ඉතිහාසය දෙස අධ්‍යයනය කරන විට බහු භාර්යා විවාහ ක්‍රමය හඳුන්වා දුන්නේ ඉස්ලාම් ධර්මය යැයි දරන අදහස් සාවද්‍ය වේ. ඊට පෙර පැවති සමාජ වල බහු භාර්යා සේවනය සිදු වූ අවස්ථා ඉතිහාසයේ ඕනෑ තරම් සඳහන් වේ. එහිදී බොහෝ විට අත්තනෝමතික සහ අවිධිමත් අයුරින් පැවති බහු භාර්යා විවාහය විධිමත් අයුරින් සකස් කිරීමට ඉස්ලාමය කටයුතු කර ඇත. අවශ්‍ය අවස්ථා වල බිරින්දෑවරුන් හතරකට සීමා කරමින් ද ඇතැම් අවස්ථාවල එක් බිරිඳකට වඩා නඩත්තු කළ නොහැකි අවස්ථාවක ඒ සංඛ්‍යාව එක් බිරිඳක් දක්වා සීමා කරමින් ඉස්ලාමීය නීතිය එය විධිමත් විවාහ ක්‍රමයක් බවට පරිවර්තනය කළ අතරම බහු භාර්යා විවාහය සමාජයේ අවශ්‍යතාවයන් හා සමාජ සාධාරණත්වය පෙරදැරි කර ගත් විවාහ ක්‍රමයක් බවට ස්ථාපිත කර ඇත.

| ලබා දුන් පිළිතුර | සිසුන් සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| ඔව් | 164 | 63.86% |
| නැත | 93 | 36.14% |
| එකතුව | 257 | 100% |

වගුව 4

ඒ අනුව බහු භාර්යා ක්‍රමය තවදුරටත් නීතිය යටතේ පැවතිය යුතු ද යන්න විමසූ විට වැඩි ප්‍රතිශතයකින් එය මෙම නීතිය යටතේ තවදුරටත් පැවතිය යුතු බව පවසා ඇත .ඒ අතරම සුළුතරයක් විසින් එම නීතිය තවදුරත් පැවතීම අවශ්‍ය නොවන බව අදහස් කර ඇත. ඒ අතරින් බහු භාර්යා විවාහය අහෝසි කළ යුතු යැයි පැවසීමට හේතු ලෙස ඔවුන් දක්වන්නේ බහුභාර්යා විවාහ අයිතිය පුරුෂයාගේ වරප්‍රසාදයක් බවත් තවදුරටත් කාන්තාවකට එයින් ඇතිවන බලපෑම තවදුරටත් නොපැවතිය යුතු බව ඔවුන් අදහස් කරන ලදී. නමුත් මේ සඳහා අදහස් දැක්වූ බහුතරයක් වූ විද්‍යාර්ථීන් අදහස් කර ඇත්තේ බහු භාර්යා විවාහ ක්‍රමය තව දුරටත් මෙම නීතිය යටතේ පැවතිය යුතු බවයි. නමුත් එලෙස මෙම බහු භාර්යා විවාහය මෙම නීතිය යටතේ පැවතිය යුතු යැයි අදහස් කළ අය අතරින් 78% ප්‍රතිශතයක් තවදුරටත් පවසා සිටියේ බහුභාර්යා විවාහයක් සිදු කර ගැනීම සඳහා දැනට විවාහ වී සිටින බිරිය හෝ බිරියන්ගේ අනුමැතිය ද ලබා ගැනීමට නෛතික විධිවිධාන සැලසිය යුතු බවයි.

### 04.6. දැවැද්ද, ස්ත්‍රී ධනම් යන අංග

ඉස්ලාමීය නීතිය තුළ කාන්තා පාර්ශ්වයෙන් ලබා ගන්නා දැවැද්ද තහනම් කොට ඇත. නමුත් දකුණු ආසියානු කලාපයේ ජීවත් වූ මුස්ලිම් ජනතාව අතර විවාහයේදී කාන්තා පාර්ශවයෙන් ලබා ගන්නා දැවැදි සහ ස්ත්‍රී ධනම් වැනි අංග හින්දු සංස්කෘතිය තුලින් මුස්ලිම් සංස්කෘතියට පසුකාලීනව එකතු වී ඇත. ඒ නිසාම අතීතයේ පැනවූ මෙම ශ්‍රී ලංකා මුස්ලිම් විවාහ සහ



Proceedings of 8th International Symposium FIA, SEUSL, 04th August 2021
ISBN 978-624-5736-14-0

දික්කසාද පනතේ ද මේ පිළිබඳ වගන්ති ඇතුලත් කොට ඇත. නමුත් ශුද්ධ ඉස්ලාමීය නීතිය තුළ දැවැද්ද, ස්ත්‍රී ධනම් යන සංකල්ප නොමැත.

| ලබා දුන් පිළිතුර | සිසුන් සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| එවැනි අංග පැවතිය යුතුයි | 30 | 11.5% |
| එවැනි අංග නොපැවතිය යුතුයි | 227 | 88.5% |
| එකතුව | 257 | 100% |

වගුව 5

ඒ අනුව මෙම පනත තුළ තවදුරටත් එවැනි අංග පැවතිය යුතුද නැද්ද යන්න විමසූ කල අදහස් ප්‍රකාශ කළ 88.5% ක් වූ වැඩි ප්‍රතිශතයක් පවසා සිටියේ මෙවැනි අංග තවදුරටත් මෙම නීතිය තුළ නොපැවතිය යුතු බවය.

එයට හේතුව කුමක්දැයි විමසූ කල මෙවැනි අංග ඉස්ලාමීය නීතියට පටහැනි වීම හේතුවෙන් ද සහ ඒවා යල් පැනගිය සම්ප්‍රදායන් බැවින් තවදුරටත් ඒවා නොතිබිය යුතුය යන ස්ථාවරය තුළ ඔවුන් සිටි බව පෙනී ගියහ. ඒ ආකාරයටම 11.5%ක ප්‍රතිශතයක් මෙම නීතියේ මෙවැනි අංග තවදුරටත් පවතිය යුතු බව අදහස් කරන කොටසක් ද අදහස් කරයි.

### 04.7. විධිමත් දික්කසාද ක්‍රමයක් මෙම නීතිය තුළට අන්තර්ගත වීම

ඕනෑම ජීවිතයකට විවාහය යනු වැදගත් ගිවිසුමකි. එහිදී අඹුසැමියන් දෙපළ අතර ඉටුකළ විය යුතුකම්, අයිතිවාසිකම් පිළිබඳව වෙන වෙනම පැහැදිලිව ඉස්ලාම් දේශනා කර ඇත. නමුත් නොගැලපීම් ඇති විටෙක විකල්පයක් නොමැති තත්ත්වයකදී වැළැක්විය නොහැකි තීන්දුවක් ලෙස දික්කසාදය ලබා දීමට ඉස්ලාමය අවසර දී ඇත. නමුත් ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත මුස්ලිම් විවාහ දික්කසාද නීතියෙහි පවතින දික්කසාද ක්‍රමය තුළ අවිධිමත් භාවයක් ඇති බව සමාජයේ සංවාදයක් ඇති විය. ඒ අනුව මෙම නීතිය සංශෝධනය කර විධිමත් දික්කසාද ක්‍රමයක් ලෙසින් මේ නීතිය තුළට අන්තර්ගත කළ යුතුද යන්න පිළිබඳව පර්යේෂණයට සහභාගී වූ පිරිසගෙන් විමසූ විට 71%ක ප්‍රතිශතයක් මෙම නීතිය සංශෝධනය කළ යුතු බව අදහස් කර ඇත. ඔවුන් එසේ අදහස් කිරීමට හේතු විමසූ කල පවතින දික්කසාද ක්‍රමයේ අඩුපාඩු රැසක් පැවැතීම ඔවුන්ගේ එසේ අදහස් දැක්වීමට ප්‍රධානතම හේතුව බව පවසා තිබුණි. ඒ අතර තවත් 29%ක ප්‍රතිශතයක් මෙම නීතිය සංශෝධනය නොකළ යුතු බව අදහස් කර ඇත.

### 04.8. දික්කසාද ක්‍රමයට අදාළ ගැටලු

ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතේ පවතින දික්කසාද ක්‍රමය වෙනස් කිරීම පිළිබඳ ඉහත ඔවුන් දැක්වූ අදහස් තවදුරටත් විමසීමේදී දැනට සංවාදයට තුඩු දී ඇති 'එකම අවස්ථාවේ තෙවරක් තලාකය පවසා සිය බිරිඳ දික්කසාද කිරීමේ ක්‍රමය' අහෝසි කළ යුතු ද යන්න මෙම පර්යේෂණයට සහභාගී වූ පිරිසෙන් විමසන ලදී.

| ලබා දුන් පිළිතුර | සිසුන් සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| අහෝසිකළ යුතුය | 146 | 56.86% |
| අහෝසි නොකළ යුතුය | 111 | 43.14% |
| එකතුව | 257 | 100% |

වගුව 6

ඒ සඳහා අදහස් දැක්වූ 56.86% ක ප්‍රතිශතයක් පවසා සිටියේ එකී එකවර තෙවරක් තලාක් පවසා බිරිය දික්කසාද කරන ක්‍රමය අහෝසි කළ යුතු බවයි. එයට හේතු ලෙස තවදුරටත්



Proceedings of 8th International Symposium FIA, SEUSL, 04th August 2021
ISBN 978-624-5736-14-0

ඔවුන් පවසා සිටියේ පුරුෂයා විසින් පීඩිත මානසිකත්වයකින් යුතු අවස්ථාවක සිටින විට එසේ පැවසුව හොත් නැවත සිය බිරිඳ සමඟ විවාහයකින් එක්කාසු වීමට දෙදෙනාටම අසීරු වීම බැවින් එකී එකවර තෙවරක් තලාක් පැවසීමේ ක්‍රමය අහෝසි කළ යුතු බවයි. මෙම දික්කසාද ක්‍රමයෙහිම තවත් අංගයක් වන මුස්ලිම්වරුන්ගේ දික්කසාද වීම් වල දී ගෙවන නඩත්තු දීමනා ගෙවීම් සමබන්ධයෙන් පවතින නීතියෙහි වෙනසක් සිදුවිය යුතු දැයි විමසූ විට ඒ සඳහා අදහස් දැක්වූ ඉහල ප්‍රතිශතයක් පවසා සිටියේ එහි සංශෝධනයක් සිදු කළ යුතු බවයි. ඒ සඳහා හේතු විමසූ විට ඔවුන් පවසා සිටියේ පවතින ක්‍රමය තුළ කාන්තාවන්ට නිසි නඩත්තු ගෙවීමක් සිදු නොවීම ප්‍රධාන ගැටලුවක් ලෙස ඔවුන් මතු කර දැක්වූ ලදි.

### 04.9. ක්වාසි අධිකරණය සඳහා නීතිඥ නියෝජනය

දැනට පවතින මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතේ ක්වාසි අධිකරණය සඳහා නීතිඥයන් හට පෙනී සිටිය නොහැක. මෙම වගන්තිය සංශෝධනය විය යුතු බව සමාජය තුළ සංවාදයක් පවතී. ක්වාසි අධිකරණය සිවිල් අධිකරණයක තත්වයට ගෙන ඒමෙන් ක්වාසි අධිකරණය තුළ නීතිඥයන්ගේ නියෝජනයක් පවත්වා ගත හැක. සැමියා හා බිරිඳ යන දෙදෙනා සඳහා නීතිඥවරුන් ඉදිරිපත් වී සිය ඉල්ලීම් හා පැමිණිලි ක්වාසි වරයාට ඉදිරිපත් කර ඔවුන්ට සාධාරණය ඉෂ්ඨ කිරීමට එතුලින් හැකි වේ. කෙසේ නමුත් ක්වාසි අධිකරණය සිවිල් අධිකරණ තත්වයට ගෙන ඒම නුසුදුසු ක්‍රියාවක් බව අදහස් දරන සංවාදයක් ද සමාජය තුළ පවතී. එයට හේතු ලෙස ඔවුන් පවසා සිටින්නේ සැමියා හා බිරිඳ යන දෙපළට වෙන්වීමට ඉඩ නොදී හැකි පමණින් එක්ව ජීවත් කර වීමට ක්වාසිවරයා උත්සහ දරන අතර එසේ නොවන අවස්ථා වලදී පමණක් දික්කසාදය සඳහා වූ ක්‍රියාපටිපය අනුගමනය කරන බැවින් දක්ෂ නීතිඥවරුගේ සහය ලබාගැනීමට සැමියා හා බිරිඳ යන දෙදෙනාම උත්සහ කරන තත්ත්වයක් උදා වීමෙන් දික්කසාදය පිළිබඳව නුසුදුසු තරගයක් සැමියා හා බිරිඳ අතර ඇතිවන බවයි.

| ලබා දුන් පිළිතුර | සිසුන් සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| නීතිඥ නියෝජනයක් අවශ්‍යයි | 227 | 88.26% |
| නීතිඥ නියෝජනයක් අනවශ්‍යයි | 30 | 11.74% |
| එකතුව | 257 | 100% |

වගුව 3

කෙසේ නමුත් මුස්ලිම් විවාහ හා දික්කසාද නීතියට අනුව මුස්ලිම්වරුන්ටම වෙන් වූ අධිකරණයක් ලෙස ස්ථාපනය කර ඇති ක්වාසි අධිකරණය මුස්ලිම්වරුන්ගේ දික්කසද අවස්ථාවන් වලදී වැදගත් තැනක් ගනී. ඒ සඳහා මෙම අධිකරණයට නීතිඥ නියෝජනයක් අත්‍යවශ්‍යද යන ප්‍රශ්නය මේ සඳහා සහභාගිවූවන් හට නැගූ විට ඒ අතරින් 88.26%ක බහුතර ප්‍රතිශතයක් අදහස් කරේ ක්වාසි අධිකරණය සඳහා නීතිඥ නියෝජනයක් අවශ්‍යය බවයි.

### 04.10. විවාහ රෙජිස්ට්‍රාර් ධූරය, ක්වාසි විනිසුරු ධූරය, ක්වාසි උපදේශක මණ්ඩලය සහ මුස්ලිම් විවාහ සහ දික්කසාද උපදේශක මණ්ඩලය සඳහා වූ කාන්තා නියෝජනය

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා රජයේ ස්වදේශ කටයුතු අමාත්‍යවරයා යටතේ ක්‍රියාත්මක ස්වදේශ කටයුතු අමාත්‍යාංශය සමග ක්‍රියා කරයි. රෙජිස්ටාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් අතර විවාහ සහ දික්කසාද ලියාපදිංචි කිරීම ද සිදු කරයි. එහිදී මුස්ලිම් විවාහ සහ දික්කසාද ලියාපදිංචි ක්‍රියාවලිය ද ක්‍රියාත්මක වන්නේ මෙම දෙපාර්තමේන්තුව හරහා ය. මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතට අනුව රෙජිස්ට්‍රාර්වරුන් ලෙස පත්වන නිලධාරීන් මුස්ලිම් පිරිමි පාර්ශවය විය යුතු අතර ඔවුන්ගේ ප්‍රධාන කාර්යය වනුයේ මුස්ලිම් ජනතාවගේ විවාහයන් ලියාපදිංචි කිරීම ය. නමුත් මෙම කොන්දේසිය



Proceedings of 8th International Symposium FIA, SEUSL, 04th August 2021
ISBN 978-624-5736-14-0

පිළිගත නොහැකි බවත් මෙම තනතුරු සඳහා මුස්ලිම් කාන්තාවන්ටද පත් කළ යුතු බවත් සමාජය තුළ සංවාදයක් පවතී. ඉස්ලාමීය නීතිය පිළිබඳ අධ්‍යනය කිරීමේදී මේ ආකාරයේ වූ තනතුරු සඳහා කාන්තාවන්ට හැකියාවක් නොමැති බව සඳහන් නොවේ. නමුත් එකී ඉස්ලාමීය නීතිය තුළම අනුව සමාජය නායකත්වය ලබා දීමේ මූලික වගකීම පැවරෙනුයේ පිරිමියාට බව සඳහන් වේ. තවද මෙවන් තනතුරක් දැරීමේදී කාන්තාවන්ට විවිධ අත්විඳීම් වලට ලක් විය හැකි දුෂ්කරතාවයන් හේතු කොට ගෙන මෙම තනතුරේ වගකීම කාන්තාවන්ට පැවරීම මුස්ලිම් සමාජය අනුමත නොකරනු ඇති බව මුස්ලිම් සමාජයේ වෙසෙන ඇතැමුන්ගේ මතයයි.

| ලබා දුන් පිළිතුර | සිසුන් සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| ක්වාසි අධිකරණයේ විනිශ්වයකාරවරුන් ලෙස පිරිමි පාර්ශ්වය පමණක් විය යුතුයි | 116 | 45.2% |
| ක්වාසි අධිකරණයේ විනිශ්වයකාරවරුන් ලෙස පිරිමි පාර්ශ්වයම නියෝජනය කිරීම අත්‍යාවශ්‍ය නොව | 141 | 54.8% |
| එකතුව | 257 | 100% |

වගුව 4

ක්වාසි අධිකරණයේ විනිශ්වයකාරවරුන් ලෙස සිදු කළ යුතු පත්වීම් වල තත්වය ද එසේමය. කෙසේ නමුත් මේ පිළිබඳව අප මෙම පර්යේෂණයට සහභාගි වූ අය අතරින් අදහස් ලබා ගත් අතර එහිදී ඔවුන්ගේ අදහස් අනුව පෙනී ගියේ පර්යේෂණය සඳහා අදහස් දැක්වූවන් අතරින් 45.2%ක වූ ප්‍රතිශතයක් ක්වාසි අධිකරණයේ විනිශ්වයකාරවරුන් ලෙස පිරිමි පාර්ශ්වය පමණක් විය යුතු බවට අදහස් කරන බවත් තවත් 54.8%ක ප්‍රතිශතයක් ක්වාසි අධිකරණයේ විනිශ්වයකාරවරුන් ලෙස පිරිමි පාර්ශ්වයම නියෝජනය කිරීම අත්‍යාවශ්‍ය නොවන බවත් අදහස් කිරීමය. මුස්ලිම් විවාහ සහ දික්කසාදන් පිළිබඳ මතු වන ගැටලු නිරාකරණය කිරීම සඳහා ශ්‍රී ලංකා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත මගින් ක්වාසි අධිකරණය හා ක්වාසි මණ්ඩලය පිහිටුවා ඇත. එකී ක්වාසි අධිකරණය හා ක්වාසි මණ්ඩලය යන ආයතන දෙකම ක්‍රියා ක්‍රියාකරන්නේ අධිකරණ අමාත්‍යාංශයේ පූර්ණ අධීක්ෂණය යටතේ ය. එයින් ක්වාසි අධිකරණයේ සේවය කරන ක්වාසිවරුන් මුස්ලිම් විවාහය සහ දික්කසාදයන් සම්බන්ධ ආරවුල් පැන නගින අවස්ථාවලදී විනිසුරුවන් ලෙස කටයුතු කරයි. එකී ක්වාසිවරුන් පත් කිරීම අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් සිදු කරයි. එක් කොට්ඨාශයක් සඳහා පත්කරනු ලබන්නේ එක් ක්වාසි වරයෙකු පමණි. එලෙස පත් වන ක්වාසිවරයා මුස්ලිම් පිරිමියෙකු විය යුතු බව පනත අවධාරණය කර ඇත. තවද ක්වාසි අධිකරණයකදී දික්කසාද ඉල්ලීම් විභාග කරන විට ක්වාසිවරයා විසින් නම් කරන පිරිමින් තිදෙනකුගෙන් සමන්විත උපදේශක මණ්ඩලයක් ක්වාසි වරයා විසින් පත් කරනු ලැබේ. තවද දික්කසාදය පිළිබඳ ක්වාසිවරයා විසින් ලබා දෙන තීන්දුව අභියෝගයට ලක් කරමින් නැවත සලකා බැලීමට ක්වාසි මණ්ඩලය වෙත අභියාචනයක් ඉදිරිපත් ඉදිරිපත් කිරීමේ බලය පනත විසින් ලබා දී ඇත. එකී අභියාචනාධිකරණය බලය ලත් ක්වාසි මණ්ඩලයේ සිටින විනිසුරු මඬුල්ල ද පිරිමි පාර්ශවයෙන් පමණක් නියෝජනය කරයි. මෙලෙස ක්වාසි අධිකරණයට සහ ක්වාසි මණ්ඩලයට පත් කරන විනිසුරුවරුන් පිරිමි පාර්ශවයෙන් පමණක් පත් කිරීම කාන්තා පාර්ශවයට සිදු කරන අසාධාරණයක් බව සමාජයේ සංවාදයක් පවතී. ඒ අනුව සමාජයේ විවිධ කාන්තා සංවිධාන සහ විවිධ මත දරන පාර්ශවයන් පනතේ ඉහත ක්වාසි අධිකරණය වල දික්කසාදයන් පිළිබඳ නඩු විභාග කරන අවස්ථාවේ දී කාසි වරුන්වරුන්ට සහාය වීම සඳහා ක්වාසි වරයා විසින් පත්කරනු ලබන ත්‍රිපුද්ගල මණ්ඩලය සඳහා සාමාජිකයන් ලෙස කාන්තාවන් ද පත් කළ යුතු බවත් ක්වාසි මණ්ඩලයේ සාමාජිකයන් සඳහා ද කාන්තා සාමාජිකාවන් ද පත් කර ගත යුතු බව අදහස් කරයි.



Proceedings of 8th International Symposium FIA, SEUSL, 04th August 2021
ISBN 978-624-5736-14-0

| ලබා දුන් පිළිතුර | සිසුන් සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| කාන්තා සහ පුරුෂ යන දෙපාර්ශ්වයම නියෝජනය වන පරිදි දෙපාර්ශවයේම නියෝජනයක් අවශ්‍යය | 233 | 90.83% |
| කාන්තා සහ පුරුෂ යන දෙපාර්ශ්වයම නියෝජනය වන පරිදි දෙපාර්ශවයේම නියෝජනයක් අවශ්‍ය නොවේ | 24 | 9.17% |
| එකතුව | 257 | 100% |

වගුව 5

ඒ අනුව ක්වාසි අධිකරණය සහ ක්වාසි මණ්ඩලය සඳහා කාන්තා සහ පුරුෂ යන දෙපාර්ශ්වයම නියෝජනය වන පරිදි විනිසුරු විනිසුරුවරියන් පත් කිරීම පිළිබඳව පර්යේෂණයට සහභාගිවූවන්ගෙන් අදහස් විමසූ පසු පර්යේෂණයට සහභාගිවූවන්ගෙන් 90.83%ක ප්‍රතිශතයක් ක්වාසි අධිකරණය සහ ක්වාසි මණ්ඩලය සඳහා කාන්තා සහ පුරුෂ යන දෙපාර්ශ්වයම නියෝජනය වන පරිදි නියෝජනයක් අවශ්‍ය බවත් තවත් 9.17% ක ප්‍රතිශතයක් එවැනි නියෝජනයක් අවශ්‍ය නොවන බවත් අදහස් කලහ.

මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත පිළිබඳව උපදෙස් ලබා දීම සහ එහි කටයුතු වල කාර්යසාධනය පිළිබඳ රෙජිස්ටාර් ජනරාල් වරයාට උපදෙස් ලබාදීම දීම සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද උපදේශන මණ්ඩලයක් ස්ථාපිත කිරීම ද මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත මගින් සිදු කර ඇත. රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා නිල බලයෙන්ම එම මණ්ඩලයේ සාමාජිකයෙකු විය යුතුය අතර අදාළ අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන හතර දෙනෙකුට නොඅඩු නව දෙනෙකුට නොවැඩි මුස්ලිම් පිරිමි සාමාජිකයන් සංඛ්‍යාවකින් මෙම උපදේශන මණ්ඩලය සමන්විත විය යුතු වේ. මෙම උපදේශක මණ්ඩලයේ කාර්ය භාරය වනුයේ මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත පිළිබඳව උපදෙස් ලබා දීම බැවින් කාන්තාවන් සම්බන්ධව ගත යුතු තීරණ සහ ලබා දිය යුතු යෝජනා දැනුම් දීමට කාන්තා සාමාජිකයන් ද මෙම උපදේශක මණ්ඩලයට පත් කළ යුතු බව සමාජයේ සංවාදයක් පවතී.

| ලබා දුන් පිළිතුර | සිසුන් සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| කාන්තා නියෝජනයක් ද ලබා යුතුය | 232 | 90.1% |
| කාන්තා නියෝජනයක් ද ලබා නොදිය යුතුය | 25 | 9.9% |
| එකතුව | 257 | 100% |

වගුව 6

ඒ අනුව මේ පිළිබඳව අප මෙම පර්යේෂණයට සහභාගි වූ අය අතරින් අදහස් ලබා ගත් අතර එහිදී ඔවුන්ගේ අදහස් අනුව පෙනී ගියේ පර්යේෂණය සඳහා අදහස් දැක්වූවන් අතරින් 90.1% ක ප්‍රතිශතයක් ක්වාසි උපදේශක මණ්ඩලය සඳහා කාන්තා නියෝජනයක් ද ලබා යුතු බවත් තවත් 9.9%ක ප්‍රතිශතයක් එවැනි නියෝජනයක් ලබා නොදිය යුතු බවට අදහස් කිරීමයි.

### 04.11. ශ්‍රී ලංකාවේ වෙසෙන මුස්ලිම්වරුන්ට ක්‍රියාත්මක වන මුස්ලිම් පුද්ගල නීතියෙහි අඩංගු මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතේ කාලෝචිතව සංශෝධනයන් සිදු විය යුතු බව පිළිගැනීමට හේතු

ඉහත කරුණු සියල්ලම සලකා බලමින් ශ්‍රී ලංකාවේ වෙසෙන මුස්ලිම්වරුන්ට ක්‍රියාත්මක වන මුස්ලිම් පුද්ගල නීතියෙහි අඩංගු මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතේ කාලෝචිතව



Proceedings of 8th International Symposium FIA, SEUSL, 04th August 2021
ISBN 978-624-5736-14-0

සංශෝධනයන් සිදු විය යුතු බව මෙම පර්යේෂණයට සහභාගි වූ අය අතරින් අදහස් ලබා ගත් අතර එහිදී ඔවුන්ගේ අදහස් අනුව පෙනී ගියේ පර්යේෂණය සඳහා අදහස් දැක්වූවන් අතරින් 67%ක ප්‍රතිශතයක් වූ පිරිස ශ්‍රී ලංකාවේ වෙසෙන මුස්ලිම්වරුන්ට ක්‍රියාත්මක වන මුස්ලිම් පුද්ගල නීතියෙහි අඩංගු මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතේ කාලෝචිතව සංශෝධනයන් සිදු විය යුතු බව අදහස් කරන බවයි.

| ලබා දුන් පිළිතුර | සිසුන් සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| සංශෝධනයන් සිදු විය යුතුය | 172 | 67% |
| සංශෝධනයන් සිදු නොවිය යුතුය | 85 | 33% |
| එකතුව | 257 | 100% |

වගුව 71

ඒ සඳහා හේතු ලෙස ඔවුන් පවසා සිටින්නේ ශුද්ධ ඉස්ලාමීය නීතියේ අඩංගු නොවන කරුණුද එම පනතේ අන්තර්ගත වී තිබීම මතත් කාලයට උචිත නොවන යල් පැන ගිය නීති එහි අන්තර්ගත වී තිබීම මතත් ගැහැණු සහ පිරිමි පාර්ශ්වයන්ට එකී නීතිය ක්‍රියාත්මක වීමෙහිලා අසමතුලිතාවයක් පැවතීම යන හේතු මත ශ්‍රී ලංකාවේ වෙසෙන මුස්ලිම්වරුන්ට ක්‍රියාත්මක වන මුස්ලිම් පුද්ගල නීතියෙහි අඩංගු මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතේ කාලෝචිතව සංශෝධනයන් සිදු විය යුතු බව පිළිගන්නා බවයි.

## 05. නිගමනය

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන මුස්ලිම් විවාහ සහ හා දික්කසාද පනතේ සිදුවිය යුතු සංශෝධනයන් පිළිබඳ ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලවල ඉගෙනුම ලබන මුස්ලිම් විද්‍යාර්ථීන් කේන්ද්‍ර කොටගෙන දියත් කරනු ලැබූ මෙම පර්යේෂණයෙන් පැහැදිලි ව පෙනී යන්නේ බහුතරයක් වූ විද්‍යාර්ථීන් මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත පිළිබඳව දැනුවත් බවක් තිබෙන අතර ඉන් වැඩි ප්‍රමාණයක් කාලෝචිතව එහි යම් යම් සංශෝධනයන් සිදු විය යුතු බව පිළිගැනීමයි. ඒ සමගම දෙපාර්ශවයක් අතර සිදුවන විවාහ නීතියේ පිළිගත් ලියාපදිංචියක් මගින් සනාථ කිරීම අනිවාර්ය කළ යුතු බව ඔවුන් අදහස් කරන බව පර්යේෂණයෙන් පැහැදිලිව සඳහන් වේ. තවද කාන්තාවන් සහ පිරිමි දෙපාර්ශවයටම පොදු වන පරිදි විවාහ වීම සඳහා අවම වයස් සීමාවක් පැනවිය යුතු බව වැඩි දෙනාගේ එකඟතාවයකින් හෙළි වී ඇත. තවද මෙහි කැපී පෙනෙන ලක්ෂණයක් අතරින් බහු භාර්යා විවාහ ක්‍රමය තවදුරටත් මෙම නීතිය යටතේ පැවතිය යුතු බව වැඩි දෙනාගේ අදහස වීමයි. ඒ සමඟම පවතින දික්කසාද ක්‍රමය සංශෝධනය කර විධිමත් දික්කසාද ක්‍රමයක් මේ නීතිය තුළට අන්තර්ගත කළ යුතු බව වැඩි දෙනාගේ අදහසය. එලෙසම ක්වාසි අධිකරණය සඳහා නීතිඥ නියෝජනයක් අවශ්‍ය වී ඇති බව ද මෙම පර්යේෂණයෙන් පැහැදිලි වේ. තවද ක්වාසි අධිකරණයේ විනිශ්චකරුවන් ලෙස පිරිමි පාර්ශවය පමණක් නොව ස්ත්‍රී පාර්ශ්වයටද ඉඩ දිය යුතු බව ඔවුන් අදහස් කරයි. තවද පිරිමි පාර්ශවයට පමණක් නොව ස්ත්‍රී පාර්ශවය ද නියෝජනය වන පරිදි ක්වාසි මණ්ඩලය, ක්වාසි උපදේශක මණ්ඩලය යන ආයතන ද සකස් විය යුතු බව ඔවුන් අදහස් කරයි.

## විමර්ශිත ග්‍රන්ථාවලිය



Proceedings of 8th International Symposium FIA, SEUSL, 04th August 2021
ISBN 978-624-5736-14-0

හේරත්, කේ. (2013), *මුස්ලිම් නීතිය*, (ප්‍රථම මුද්‍රණය), විජයයි ප්‍රකාශකයෝ.

අධිකරණ අමාත්‍යාංශය, (2012), *අධිකරණ අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව*, www.justiceministry.gov.lk

ඉස්ලාමීය තොරතුරු හා පර්යේෂණ පදනම, *මුස්ලිම් විවාහ හා දික්කසාද පනත සංශෝධනය කිරීම සඳහා සඳහා අධිකරණ අමාත්‍යාංශයට බාරදී ඇති සලීම් මර්සූෆ් වාර්තාව සහ ෆායිස් මුස්තාපා වාර්තාව පිළිබඳ සංසන්දනාත්මක සංක්ෂිප්ත වාර්තාව*, www.iirf.lk

සිල්වා, ජී., ප්‍රේමතිලක, එන්., *ශ්‍රී ලංකාවේ ග්‍රාමීය සමාජ පිළිලය*, බාල වයස් විවාහ පිළිබඳ සමාජ විද්‍යාත්මක විමසුමක්.

බණ්ඩාරනායක, පී. *ශ්‍රී ලංකා පවුල් නීතිය තුළ පවතින නීති පිළිගැටුම් හඳුනා ගැනීම සහ ප්‍රතිකර්ම නිර්දේශනය.*

Shukry, M.A.M. (1986), *Muslims of Sri Lanka: Avenues to Antiquity*, Jamia naleemia Institute.

හමීන්, එච්., ඉස්සඩීන්, එච්.එස්. (2016), *අසමාන පුරවැසියෝ*, ශ්‍රී ලංකාවේ යුක්තිය සහ සමානාත්මතාවය සඳහා මුස්ලිම් කාන්තා අරගල වාර්තාව.

ඉස්මාර්ල්, එන්. (2004), *පාරිශුද්ධ වූ අල් කුර්ආන්*: අර්ථය සිංහල භාෂාවෙන්, (ප්‍රථම මුද්‍රණය), හාදි බුක්ඩිපෝට්.



Proceedings of 8th International Symposium FIA, SEUSL, 04th August 2021
ISBN 978-624-5736-14-0